නීති ආධාර කොමිෂන් සභාව - 2010

----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

**1**.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ක්ෂය ගණනය කිරීමේදී ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන ඇස්තමේන්තු කළ යුතු නමුත් කොමිසම විසින් ක්ෂය ගණනය කිරීමේදී සියළුම වත්කම් 5% ක ප්‍රමාණයකින් හීනවන ශේෂ ක්‍රමයට ගණනය කර තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ මුදල් හා මුදල් සමාන ශේෂය රු.11,591,896 ක් ලෙස දක්වා ඇති අතර, එම ශේෂය තුළ රු.750,000ක ස්ථාවර තැන්පතු ශේෂයක් ඇතුලත් කර තිබුණි.

1.2.2 **නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

**පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී අනාවරණය විය.**

| **නීති, රීති රෙගුලාසිය** | **අනුකූල නොවීම** |
|---|---|
| (I) ආයතන සංග්‍රහයේ XIV පරිච්ජේදය සහ 2010 ජූනි 07 උනැති අංක 9/2010 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කළුතර නීති නිලධාරිනියට ගමන් වියදම් සඳහා ගෙවීම් කිරීමේදී කිලෝමීටර් 1ක් සඳහා රු.15ක දීමනාවක් ආයතනය ගෙවා තිබූ අතර, ගෙවිය යුතු සැතපුම් කුළී දීමනාව වෙනුවට නියමිත සීමාව ඉක්මවා ගෙවීම හේතුවෙන් 2010 පෙබරවාරි මස සිට 2010 අගෝස්තු දක්වා රු. 21,130ක මුදලක් සැතපුම් කුළී දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2:1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 6,423,543 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,622,275ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 1,801,268ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. රජයේ ප්‍රදාන හා ලියාපදිංචි ගාස්තු රු. 10,954,772 ක් වැඩිවීම හා පරිපාලන හා මූල්‍ය වියදම් රු. 9,153,504 කින් වැඩිවීම මේ සඳහා බෙහෙවින් බලපා තිබුණි.

2.2 **කාර්ය සාධනය**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(අ) **සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාව සහ එහි ප්‍රාදේශිය මධ්‍යස්ථාන මගින් නඩු කටයුතු 3252ක් අවසන් කර තිබුණි.**

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් මධ්‍යස්ථාන 57ක් මගින් පුද්ගලයින් 39001ක් සඳහා නීති උපදෙස් ලබා දී තිබුණි.

2.3 **සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

2003 ජූනි 02 දින හා අංක පීඑෆ් 12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛණයේ 5 ජේදය පරිදි සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එහි පිටපතක් අදාල වර්ෂය ආරම්භවීමට දින 15කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මෙම වාර්තාව නිකුත් කරන දිනටත් එවා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය